18557

AL/2026/25/S-I

සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2026
General Certificate of Education (Adv. Level) Examination, 2026

ශ්‍රී ලංකා ඉතිහාසය I (I කොටස)
இலங்கை வரலாறு I (பகுதி I)
History of Sri Lanka I (Part I)

25 S I

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

ශ්‍රී ලංකා ඉතිහාසය - ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1978 දක්වා

විභාග අංකය: ...................................

**උපදෙස්:**

※ මෙම ප්‍රශ්න පත්‍රය I හා II ලෙස කොටස් **දෙකකින්** සමන්විත වේ.
※ **I කොටසෙහි 1 - 40** දක්වා ප්‍රශ්න **සියල්ලට ම මෙම පත්‍රයේ ම ලබා දී ඇති උපදෙස් පරිදි** පිළිතුරු සපයන්න.
※ **I සහ II කොටසෙහි** නිවැරදි පිළිතුරක් සඳහා ලකුණු **එක** බැගින් හිමි වේ.
※ කොටස් **දෙකට ම** මුළු කාලය **පැය තුනකි**. පිළිතුරු ලියා අවසන් වූ පසු **I කොටස**, **II කොටසේ** පිළිතුරු පත්‍ර සමග **අමුණා භාර දෙන්න.**

**පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි.**

| පිටු අංකය | ප්‍රශ්න අංකය | ලකුණු |
|---|---|---|
| 1 | 1 - 6 | |
| 2 | 7 - 16 | |
| 3 | 17 - 22 | |
| 4 | 23 - 27 | |
| 5 | 28 - 35 | |
| 6 | 36 - 40 | |
| එකතුව | | |

| | අත්සන | සංකේත අංකය |
|---|---|---|
| 1 වන පරීක්ෂක | | |
| 2 වන පරීක්ෂක | | |
| අතිරේක ප්‍රධාන පරීක්ෂක | | |
| ගණිත පරීක්ෂක | | |
| ප්‍රධාන පරීක්ෂක | | |

## I කොටස

● අංක **1** සිට **10** තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් **පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් **එකක්** පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමග **නොගැළපේ**. එම **නොගැළපෙන** නම කුමක් දැයි හඳුනාගෙන එහි **අංකය වරහන තුළ** ලියන්න.

**1.** (1) සූකරතිත්ථ (2) මහාතිත්ථ (3) ගෝකණ්ණ (4) කච්චකතිත්ථ (5) ජම්බුකෝලපට්ටන (.........)

**2.** (1) ථුල්ලත්තන (2) වට්ටගාමණී (3) ලජ්ජිතිස්ස (4) බල්ලාටනාග (5) වෝහාරිකතිස්ස (.........)

**3.** (1) සේනාපති (2) භොජකපති (3) උදකපති (4) දකපති (5) මතෙරමජිබකපති (.........)

**4.** (1) ගණ්ඨාකාර (2) බුබ්බුලාකාර (3) ඝටාකාර (4) ධාන්‍යාකාර (5) සර්පිලාකාර (.........)

**5.** (1) පරරාජසේකරම් (2) එදිරිමානසිංහම් (3) අරිට්ඨකිවේණ්ඩු (4) පුවිරාජ පණ්ඩාරම් (5) වරෝදය විංකෙයිආරියාන් (.........)

**6.** (1) උඩබුලත්ගම (2) කොත්මලේ (3) දුම්බර (4) තුම්පනේ (5) නමන්කඩුව (.........)

[දෙවැනි පිටුව බලන්න.

Past Papers Wiki

7. (1) සේනාසම්මත වික්‍රමබාහු (2) කරල්ලියද්දේ බණ්ඩාර (3) සේනාලංකාධිකාර
(4) ජයවීර බණ්ඩාර (5) සෙනරත් (.........)

8. (1) රිස් ඩේවිඩ්ස් (2) තෝමස් මේට්ලන්ඩ් (3) හෙන්රි වෝඩ්
(4) ආතර් ගෝර්ඩන් (5) වෙස්ට් රිජ්වේ (.........)

9. (1) සරසවි සඳරැස (2) රසවාහිනී (3) ලක්මිණි පහන
(4) ලක්රිවිකිරණ (5) සිංහල බෞද්ධයා (.........)

10. (1) ඩී. එස්. සේනානායක (2) ඩඩ්ලි සේනානායක (3) ජෝන් කොතලාවල
(4) ඇන්. ඇම්. පෙරේරා (5) එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක (.........)

- අංක **11** සිට **15** තෙක් ප්‍රශ්නවල **පද යුගල පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක යුගලයක පද එකිනෙකට **නොගැළපේ.** එම **නොගැළපෙන** යුගලය කුමක් ද'යි හඳුනාගෙන ඊට අදාළ **අංකය,** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

11. (1) තිලෝකසුන්දරී - පළමුවන විජයබාහු
(2) රත්නාවලී - මනාභරණ
(3) ලීලාවතී - පළමුවන පරාක්‍රමබාහු
(4) සුනේත්‍රා දේවී - හයවන පරාක්‍රමබාහු
(5) කුසුමාසන දේවී - පළමුවන විමලධර්මසූරිය (.........)

12. (1) නිකායසංග්‍රහය - දේවරක්ඛිත ජයබාහු ධර්මකීර්ති හිමි
(2) සිංහල බෝධිවංසය - විල්ගම්මුල හිමි
(3) දම්පියා අටුවා ගැටපදය - පස්වන කාශ්‍යප
(4) ගුත්තිල කාව්‍යය - වැත්තෑවේ හිමි
(5) ඇහැලේපොල හටන - රණස්ගල්ලේ හිමි (.........)

13. (1) මුල්ලේරියා සටන - ජුවාඕ රිබෙයිරෝ
(2) දන්තුරේ සටන - පේරෝ ලෝපේස් ද සූසා
(3) බලන සටන - දොන් ජෙරනිමෝ ද අසවේදු
(4) රන්දෙණිවෙල සටන - කොන්ස්තන්තීනු ද සා ද නොරොඤ්ඤා
(5) ගන්නොරුව සටන - දියෝගෝ ද මෙලෝ ද කස්ත්‍රෝ (.........)

14. (1) නූනෝ අල්වාරෙස් පෙරෙයිරා - පෘතුගීසි කපිතාන් ජෙනරාල්වරයෙකි
(2) ජාකොමේ ගොන්සාල්වේස් - ප්‍රංශ ජාතික පූජකවරයෙකි
(3) විලෙම් ෆන් ඉම්හොෆ් - ලන්දේසි ආණ්ඩුකාරවරයෙකි
(4) ජේම්ස් ටේලර් - ඉංග්‍රීසි ජාතික වැවිලිකරුවෙකි
(5) එච්. සී. පී. බෙල් - බ්‍රිතාන්‍ය ජාතික සිවිල් සේවකයෙකි (.........)

15. (1) කොළඹ-මහනුවර මාර්ගය ඉදිකරවීම - එඩ්වඩ් බාන්ස්
(2) මාර්ග බද්ද පැනවීම - ටොරින්ටන් සාමි
(3) ගම්සභාව යළි පිහිටුවීම - හර්කියුලිස් රොබින්සන්
(4) ධාන්‍ය බද්ද අහෝසි කිරීම - ආතර් හැව්ලොක්
(5) කෞතුකාගාරය පිහිටුවීම - ජේම්ස් ලොන්ඩන් (.........)

- අංක **16** සිට **20** තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම / ප්‍රකාශන / දින වකවානු සමූහයක් **X** සහ **Y** තීරවල දී ඇත. **Y** තීරයේ දී ඇති නාම / ප්‍රකාශන / දින වකවානු **X** තීරයේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට **නොවේ. Y** තීරය, **X** තීරය සමඟ ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට පහත දී ඇති සංයෝග පහෙන් **එකක්** නිවැරදි ය. නිවැරදි සංයෝගයට අයත් **අංකය** තෝරා **වරහන තුළ** ලියන්න.

16.

| | X | | Y |
|---|---|---|---|
| (i) | සිරි මේඝවණ්ණ | A | - තෝනිගල සෙල්ලිපිය |
| (ii) | හතරවන උදය | B | - දෙවනගල සෙල්ලිපිය |
| (iii) | පළමුවන විජයබාහු | C | - හෝපිටිගම සෙල්ලිපිය |
| (iv) | කීර්ති ශ්‍රී රාජසිංහ | D | - පනාකඩුව තඹ සන්නස |
| (v) | පළමුවන පරාක්‍රමබාහු | E | - ගැටබේරිය සන්නස |

(1) A B C E D (2) A C D E B (3) A D C B E (4) B E A C D (5) C E D B A (.........)

විභාග අංකය : ..........................

**17.**

| X | Y |
|---|---|
| (i) සපුමල් කුමාරයා | A - පළමුවන විමලධර්මසූරිය |
| (ii) ටිකිරි බණ්ඩාර | B - දෙවන රාජසිංහ |
| (iii) මහ අස්ථාන | C - හයවන බුවනෙකබාහු |
| (iv) කොනප්පු බණ්ඩාර | D - අටවන වීරපරාක්‍රමබාහු |
| (v) අම්බුළුගල කුමාරයා | E - පළමුවන රාජසිංහ |

(1) A E B C D (2) A D C E B (3) B D E A C (4) C D B A E (5) C E B A D (.........)

**18.**

| X | Y |
|---|---|
| (i) ජෝන් ඩොයිලි | A - ලංකාව |
| (ii) හෙන්රි මාෂල් | B - ලංකාවේ එකොළොස් වසක් |
| (iii) තෝමස් ස්කිනර් | C - ලක්දිව පුරාතන වාරිමාර්ග |
| (iv) ජොනතන් ෆෝබ්ස් | D - සිංහලේ ආණ්ඩුක්‍රමය පිළිබඳ ලුහුඬු සටහන් |
| (v) ආර්. එල්. බ්‍රෝහියර් | E - ලංකාවේ පනස් වසක් |

(1) A B D C E (2) B A E C D (3) D A E B C (4) D C B E A (5) E A C B D (.........)

**19.**

| X | Y |
|---|---|
| (i) ටොලමි | A - ලංකාවේ පෘතුගීසි ප්‍රතිපත්තිය පිළිබඳ විවේචනය |
| (ii) ප්ලීනි | B - ලංකාව දැක්වෙන මුල්ම සිතියම |
| (iii) පාහියන් | C - ශ්‍රී පාද වන්දනා ගමනක් පිළිබඳ විස්තරය |
| (iv) ඉබ්න් බතුතා | D - අභයගිරි විහාරය පිළිබඳ විස්තරය |
| (v) ක්වේරෝස් | E - රෝමයට යවන ලද ලංකා දූත ගමන පිළිබඳ විස්තරය |

(1) A B E D C (2) A C B D E (3) B D E A C (4) B E D C A (5) C D A E B (.........)

**20.**

| X | Y |
|---|---|
| (i) චාල්ස් ද සිල්වා බටුවන්තුඩාව | A - කම්කරු ඇමති |
| (ii) ඩී. බී. ජයතිලක | B - සන්නිවේදන හා වැඩ ඇමති |
| (iii) ටී. බී. පානබොක්කේ | C - ස්වදේශ කටයුතු ඇමති |
| (iv) පෙරී සුන්දරම් | D - සෞඛ්‍ය ඇමති |
| (v) මොහොමඩ් මාකන් මාකර් | E - පළාත් පාලන ඇමති |

(1) A D E C B (2) A E B C D (3) B A C E D (4) C D A E B (5) E C D A B (.........)

- අංක **21** සිට **25** තෙක් සෑම ප්‍රශ්නයකට ම එක් මාතෘකාවක් යටතේ කරුණු **පහ** බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් **එකක් අදාළ මාතෘකාවට නොගැළපේ.** එය තෝරා, ඊට අදාළ **අංකය** ඉදිරියෙන් ඇති **වරහන තුළ** ලියන්න.

PAST PAPERS WIKI

**21. වලගම්බා රාජ්‍ය සමය**

(1) සත් ද්‍රවිඩ ආක්‍රමණය
(2) තිය බ්‍රාහ්මණයාගේ කැරැල්ල
(3) එක්නැලියා සාගතය
(4) පෞද්ගලික ආරාම පූජාව
(5) ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම (.........)

**22. ඉසුරුමුණි කැටයම්**

(1) 'මිනිසා සහ අශ්ව හිස' ප්‍රධානතම කැටයමකි.
(2) 'ඉසුරුමුණි පෙම් යුවල' කැටයමෙන් සාලිය හා අසෝකමාලා විදහා දැක්වෙතැයි සැලකේ.
(3) නාග රූප කැටයම් සහිත කුට්ටම් පොකුණ ඉසුරුමුණියේ පිහිටා ඇත.
(4) දිය කෙළින ඇතුන්ගේ රූප කැටයම් කොට ඇත.
(5) ඉසුරුමුණි කැටයම්වලට පල්ලව කලා සම්ප්‍රදායේ ආභාසය ලැබී ඇතැයි සැලකේ. (.........)

Past Papers Wiki



**23. ලන්දේසීන් හා උඩරට රාජධානිය අතර සබඳතා**

(1) 1602 දී ලන්දේසි නියෝජිත පිරිසක් පළමුවන විමලධර්මසූරිය රජු හමුවිය.
(2) 1638 දී ලන්දේසීහු උඩරට රාජධානිය සමග ගිවිසුමකට එළඹුණහ.
(3) 1765 දී ලන්දේසීහු උඩරට ආක්‍රමණය කළහ.
(4) 1766 දී ලන්දේසීන් හා උඩරට රජු අතර ගිවිසුමක් අත්සන් තැබිණි.
(5) ජෝශප් වාස් පියතුමා ලන්දේසි අනුග්‍රහය ඇතිව උඩරට කතෝලික දහම ප්‍රචාරය කළේ ය. (.........)

**24. කෝල්බෘක්-කැමරන් ප්‍රතිසංස්කරණ යෝජනා**

(1) ආණ්ඩුකාරවරයාගේ බලතල අඩුකිරීම
(2) රාජකාරි ක්‍රමය අහෝසි කිරීම
(3) ඒකීය පරිපාලන ක්‍රමයක් ඇතිකිරීම
(4) සිවිල් සේවකයන්ගේ වැටුප් වැඩි කිරීම
(5) ව්‍යවස්ථාදායක හා විධායක සභා පිහිටුවීම (.........)

**25. ශ්‍රී ලංකාවට නිදහස ප්‍රදානය කිරීම**

(1) 1948 පෙබරවාරි 4 දින ශ්‍රී ලංකාවට ඩොමීනියන් තත්ත්වය ප්‍රදානය කරනු ලැබීය.
(2) නිදහස් ශ්‍රී ලංකාවේ පළමුවන අග්‍රාණ්ඩුකාරවරයා වශයෙන් සෝල්බරි සාමි පත් කෙරිණි.
(3) ශ්‍රී ලංකාව පොදු රාජ්‍ය මණ්ඩලය තුළ නිදහස්, ස්වයංපාලිත රටක් බවට පත් විය.
(4) බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව විසින් 1947 ලංකා නිදහස් පනත සම්මත කරනු ලැබීමෙන් පසුව ශ්‍රී ලංකාවට නිදහස ප්‍රදානය කෙරිණි.
(5) එංගලන්තයේ රජු තවදුරටත් ශ්‍රී ලංකාවේ රාජ්‍ය නායකයා විය. (.........)

- අංක **26** සිට **30** තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති **(A), (B), (C)** සහ **(D)** යන ප්‍රතිචාර හතර අතුරෙන් **එකක් හෝ කිහිපයක් හෝ** නිවැරදි ය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා,

**(A)** සහ **(B)** පමණක් නිවැරදි නම් ........................................ **1** ද,
**(A)** සහ **(C)** පමණක් නිවැරදි නම් ........................................ **2** ද,
**(B)** සහ **(C)** පමණක් නිවැරදි නම් ........................................ **3** ද,
**(C)** සහ **(D)** පමණක් නිවැරදි නම් ........................................ **4** ද,
**වෙනත් ප්‍රතිචාර** සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදි නම් ......... **5** ද, **වරහන තුළ** ලියන්න.

| උපදෙස් සම්පිණ්ඩනය | | | | |
|---|---|---|---|---|
| **1** | **2** | **3** | **4** | **5** |
| **(A)** සහ **(B)** පමණක් නිවැරදි ය. | **(A)** සහ **(C)** පමණක් නිවැරදි ය. | **(B)** සහ **(C)** පමණක් නිවැරදි ය. | **(C)** සහ **(D)** පමණක් නිවැරදි ය. | **වෙනත් ප්‍රතිචාර** සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදි ය. |

**26.** දිවයිනේ මුල් ජනාවාස පිහිටුවීම සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?

(A) වංසකතාවලට අනුව මුල් පදිංචිකරුවෝ උතුරු ඉන්දියාවේ සිට මෙරටට පැමිණියහ.
(B) මුල් ජනාවාස වියළි කලාපයේ ගංගා නිම්නාශ්‍රිතව පිහිටුවන ලද්දේ ය.
(C) මහාවංසයට අනුව මුල් ජානපදිකයන්ගේ ප්‍රධානතම ජීවනෝපාය වූයේ වෙළෙඳාමයි.
(D) සොත්ථිශාලා යනු මුල් ජනාවාසවල පැවති පොදු රැස්වීම් ශාලා ය. (.........)

**27.** වසභ රජුගේ පාලන සමය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?

(A) වසභ රජු ලම්භකර්ණ වංශයෙහි ආරම්භක පාලකයා විය.
(B) වසභ රජුගේ කාලයට අයත්වන සෙල්ලිපි දිවයිනේ විවිධ ප්‍රදේශවලින් හමු වේ.
(C) වල්ලිපුරම් රන්පත වසභ රජුගේ කාලයට අයත් වේ.
(D) විශාල පරිමාණයේ වැව් ඉදිකිරීම වසභ රජුගේ කාලයෙහි දී ආරම්භ විය. (.........)

**28.** රජරට ශිෂ්ටාචාරයේ පරිහානිය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?
(A) යාපන රාජධානියෙන් එල්ල වූ තර්ජන
(B) කාලිංග මාඝගේ ආක්‍රමණය හා ඔහුගේ පාලනයේ ප්‍රතිඵල
(C) වාරිමාර්ග නිසි පරිදි නඩත්තු නොකිරීම
(D) මහාමාරිය වසංගතය පැතිරයාම (.........)

**29.** උඩරට රාජධානියේ පරිපාලනය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?
(A) ශ්‍රී විජය රාජසිංහ රජු අදිකාරම් තනතුරු තුනක් ඇති කළේ ය.
(B) රාජාධිරාජසිංහ රජු ඇහැලේපොළ මහාදිකාරම වගයෙන් පත් කළේ ය.
(C) රජුගේ සහ රජවාසල සේවා අවශ්‍යතා සපුරා ගැනීමේ ප්‍රධාන මාර්ගය වූයේ බද්ද සංවිධානය යි.
(D) මරණ දණ්ඩනය නියම කිරීමේ බලතල පැවතියේ රජුට පමණි. (.........)

**30.** ජනසතු කිරීමේ ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?
(A) 1956 දී තේරී පත් වූ ආණ්ඩුව ජනසතු කිරීමේ ප්‍රතිපත්තිය ආරම්භ කළේ ය.
(B) ජේ. ආර්. ජයවර්ධන විසින් දෙන ලද මැතිවරණ පොරොන්දුවක් මත ජනසතු කිරීමේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක විය.
(C) 1958 වසරේ දී බස් සේවා ජනසතු කිරීම සිදු කෙරිණි.
(D) 1960 දී වතු ජනසතු කිරීම සිදු කෙරිණි. (.........)

● අංක **31** සිට **35** තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා, එහි **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**31.** ශ්‍රී ලංකාවේ ප්‍රාග්-ඓතිහාසික යුගයට අයත් පැරණිතම සාධක හමුවී ඇති ස්ථානය කුමක් ද?
(1) දැරණියගල ගුහාව
(2) හගවා ලෙන
(3) පතිරාජවෙල
(4) ආසන ගුහාව
(5) අටසැට ලෙන (.........)

**32.** රජකම ලබාගැනීම සඳහා මුල් වරට ඉන්දීය හමුදා ආධාර ලබාගත් ලාංකේය පාලකයා කවරෙක් ද?
(1) පළමුවන සිරිනාග
(2) ඉළනාග
(3) දෙවන සිරිනාග
(4) කුජ්ජනාග
(5) මහානාග (.........)

**33.** ගම්පොළ යුගයට අයත් ලංකාතිලක විහාරයේ ගෘහනිර්මාණ ශිල්පියා කවරෙක් ද?
(1) දේවේන්ද්‍ර මූලාචාරී
(2) ගණේශ්වරාචාර්ය
(3) ස්ථපතිරායර
(4) නිලගම පටබැන්දා
(5) දෙවරගම්පළ සිල්වත්තැන (.........)

**34.** වැලිවිට සරණංකර සංඝරාජ තෙරුන්ගේ ගුරු හිමියන් කවරෙක් ද?
(1) සූරියගොඩ උන්නාන්සේ
(2) කොරතොට ධම්මක්ඛන්ද හිමි
(3) දෙවනගල රතනාලංකාර හිමි
(4) තිබ්බොටුවාවේ ශ්‍රී සුමංගල හිමි
(5) වාරියපොළ ශ්‍රී සුමංගල හිමි (.........)

**35.** 1848 අරගලයේ දී අභිෂේක කරනු ලැබූ නායකයා කවරෙක් ද?
(1) පුරන් අප්පු
(2) කිවුලේගෙදර මොහොට්ටාල
(3) නිකපිටියේ බණ්ඩාර
(4) අඹන්වෙල රාළ
(5) ගොංගාලේගොඩ බණ්ඩා (.........)

- අංක **36** සිට **40** තෙක් ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දක්වෙන **1, 2, 3, 4** සහ **5** යන කවර ප්‍රකාශ යුගලය දැ'යි තෝරා ඊට අදාළ **අංකය වරහන තුළ** ලියන්න.

| | **පළමුවන ප්‍රකාශය** | **දෙවන ප්‍රකාශය** |
|---|---|---|
| **1** | නිවැරදි ය. | වැරදි ය. |
| **2** | නිවැරදි ය. | නිවැරදි ය. |
| **3** | වැරදි ය. | වැරදි ය. |
| **4** | වැරදි ය. | නිවැරදි ය. |
| **5** | නිවැරදි ය. | නිවැරදි වන අතර **පළමුවැන්න** මැනවින් පහදා දෙයි. |

| | **පළමුවන ප්‍රකාශය** | **දෙවන ප්‍රකාශය** | |
|---|---|---|---|
| **36.** | පොළොන්නරුවේ දෙමළ මහා සෑය පළමුවන රාජරාජ රජු විසින් ඉදිකරවන ලදී. | ජාතක කථා පොත දඹදෙණි රාජධානි සමයේ දී රචනා කරන ලද්දේ ය. | (.........) |
| **37.** | නිශ්ශංක අලගක්කෝණාර විසින් දාරු ග්‍රාමයෙහි ඉදිකරවන ලද බලකොටුව කෝට්ටේ රාජධානිය සඳහා පදනම සකස් කළේ ය. | කෝට්ටේ හයවැනි පරාක්‍රමබාහු රජ සමයේ දී ජෝතිය සිටාණන් කැරැල්ලක් මෙහෙයවී ය. | (.........) |
| **38.** | කැලණිය අලුත් විහාරයේ බිතුසිතුවම් අඳින ලද්දේ සෝලියස් මැන්ඩිස් විසිනි. | රාජ්‍ය මන්ත්‍රණ සභාවේ ප්‍රථම කථානායකවරයා වූයේ ෆ්‍රැන්සිස් මොලමුරේ ය. | (.........) |
| **39.** | 1959 දී විද්‍යෝදය විශ්වවිද්‍යාලය පිහිටුවන ලදී. | ලංකා විශ්වවිද්‍යාලයේ පළමුවන උපකුලපතිවරයා වූයේ නිකලස් ආටිගල ය. | (.........) |
| **40.** | විසිවන සියවසේ දෙවන දශකයේ අග සිට ලංකා ජාතික සංගමය ශ්‍රී ලංකාවේ ජාතික ව්‍යාපාරයෙහි ලා ප්‍රධාන භූමිකාවක් ඉටුකළේ ය. | ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ හා ශ්‍රී ලාංකිකයන්ගේ අයිතිවාසිකම් ලබාගැනීම උදෙසා පොන්නම්බලම් අරුණාචලම්ගේ සභාපතිත්වයෙන් යුතු ව 1919 දී පිහිටුවන ලද ලංකා ජාතික සංගමය බ්‍රිතාන්‍ය පාලකයන් සමග සාකච්ඡා පැවැත්වී ය. | (.........) |

※※

සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2026
General Certificate of Education (Adv. Level) Examination, 2026

| | | | |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ඉතිහාසය<br>இலங்கை வரலாறு<br>History of Sri Lanka | I<br>I<br>I | 25 | S |

ප්‍රශ්න අංකය / வினா இல. / Question No. **1**

විභාග අංකය / சுட்டெண் / Index No. ....................................



Past Papers Wiki



සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2026
General Certificate of Education (Adv. Level) Examination, 2026

| | | |
|---|---|---|
| ශ්‍රී ලංකා ඉතිහාසය | I (II කොටස) | 25 S I |
| இலங்கை வரலாறு | I (பகுதி II) | |
| History of Sri Lanka | I (Part II) | |

**ශ්‍රී ලංකා ඉතිහාසය - ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1978 දක්වා**

**උපදෙස්:**

※ පිළිතුරු සැපයිය යුතු **මුළු** ප්‍රශ්න සංඛ්‍යාව **හතරකි.**

※ **II කොටස A, B** හා **C** ලෙස කොටස් **තුනකින්** සමන්විත වේ.

※ **A කොටසේ** ප්‍රශ්නය අනිවාර්ය වේ.

※ **B** හා **C කොටස්වලින්** එක් කොටසකින් අවම වශයෙන් **එක** ප්‍රශ්නයක්වත් තෝරා ගෙන **තවත්** ප්‍රශ්න **තුනකටත්** පිළිතුරු සපයන්න.

(**පළමුවන** ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා **ශ්‍රී ලංකාවේ දළ සිතියමක් I කොටස** සමඟ සපයා ඇත.)

## A කොටස

**1.** ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් **සියලු ම ස්ථාන ලකුණු කොට නම් කරන්න.**

(i) කදම්බ නදී (ii) කතරගම (iii) සබරගමු පළාත

(iv) කලා වැව (v) නල්ලූර් (vi) හලාවත

(vii) සෙංකඩගල (viii) ලංකා පටුන (ix) කයිට්ස්

(x) කැලණි ගඟ (xi) පොළොන්නරුව (xii) කෝට්ටේ

(නිවැරදි ව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු **01** බැගිනි.)

## B කොටස

**2.** අනුරාධපුර යුගයේ අවසානය තෙක් ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැදෑරීමෙහිලා පාලි වංසකතාවල ඇති වැදගත්කම පරීක්ෂා කරන්න. (ලකුණු 16 යි)

**3.** "කාවන්තිස්ස රජු විසින් දමන ලද පදනම මත එළාර රජු පරාජය කළ දුටුගැමුණු රජු මුළු දිවයිනම එක්සේසත් කළේ ය."

(i) කාවන්තිස්ස රජුගේ පියා නම් කරන්න. (ලකුණු 01 යි)

(ii) දුටුගැමුණු රජුගේ සහෝදරයා නම් කරන්න. (ලකුණු 01 යි)

(iii) කාවන්තිස්ස රජු රෝහණය පාලනය කළ අවධියේ දී රජරට පැවති දේශපාලන තත්ත්වය පිළිබඳ කෙටි සටහනක් ලියන්න. (ලකුණු 04 යි)

(iv) කාවන්තිස්ස රජු විසින් ඉටු කරන ලද භූමිකාව කෙරෙහි අවධානය යොමු කරමින් දුටුගැමුණු රජුගේ දේශපාලන කාර්ය සාඵල්‍යය ප්‍රමාණ කරන්න. (ලකුණු 10 යි)

**4.** පහත දැක්වෙන තේමා යටතේ පොළොන්නරු යුගයේ සංස්කෘතික තත්ත්වය පරීක්ෂා කරන්න.

(i) ආගමික වර්ධනය (ලකුණු 06 යි)

(ii) කලාව හා ගෘහනිර්මාණ ශිල්පය (ලකුණු 10 යි)

PAST PAPERS WIKI

අටවැනි පිටුව බලන්න.

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාළ ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

**5.** පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑ ම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(i) ධාතුසේන රජු

(ii) අනුරාධපුර හා පොළොන්නරු අවධීන්හි විදේශ වෙළෙඳාම

(iii) දඹදෙණි යුගයේ සංස්කෘතිය හා සාහිත්‍යය

(iv) යාපන රාජධානිය හා දිවයිනේ අනෙකුත් රාජධානි අතර සබඳතා

(ලකුණු 08 × 2 = 16 යි)

## C කොටස

**6.** ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල පෘතුගීසීන් හා ලන්දේසීන් විසින් අනුගමනය කරන ලද ආර්ථික ප්‍රතිපත්ති පහත සඳහන් මාතෘකා යටතේ සංසන්දනය කරන්න.

(i) ප්‍රධාන අරමුණු

(ii) අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග (ලකුණු 16 යි)

**7.** "1817-1818 ජනතා නැගීසිටීම ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය පාලනයට එරෙහිව එල්ල වූ ප්‍රබලතම විරෝධතා ව්‍යාපාරය විය."

(i) ජනතා නැගීසිටීම ඇති වූ අවධියේ ශ්‍රී ලංකාවේ සේවය කළ බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා නම් කරන්න. (ලකුණු 01 යි)

(ii) එකල උඩරට සිටි බ්‍රිතාන්‍ය රෙසිඩන්ට්වරයා නම් කරන්න. (ලකුණු 01 යි)

(iii) උඩරට ගිවිසුමේ ප්‍රධාන වගන්ති පිළිබඳ කෙටි සටහනක් ලියන්න. (ලකුණු 04 යි)

(iv) 1817-1818 ජනතා නැගීසිටීමට තුඩු දුන් සාධක විචාරාත්මකව විමසන්න. (ලකුණු 10 යි)

**8.** බ්‍රිතාන්‍යයන් යටතේ ශ්‍රී ලංකාවේ තේ වගාවෙහි ආරම්භය හා ව්‍යාප්තිය කෙරෙහි බලපෑ සාධක පරීක්ෂා කරන්න. (ලකුණු 16 යි)

**9.** පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑ ම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(i) ඉස්ලාම් පුනර්ජීවන ව්‍යාපාරයේ නායකයෝ

(ii) බ්‍රිතාන්‍ය පාලන සමයේ ගොවි ජනපද ව්‍යාපාරය

(iii) සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර

(iv) විධායක ජනාධිපති ධුරය (ලකුණු 08 × 2 = 16 යි)

* * *

PAST PAPERS WIKI

WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library